සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා
චක්‍රලේඛ ලිපි අංක :- 22/2020

මගේ අංකය:- PPSC/ES/07/FI/06/18-3
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
සබරගමුව පළාත් සභා කාර්යාල සංකීර්ණය,
නවනගරය, රත්නපුර,
2020.10.15

සබරගමුව පළාත් සභාවේ,
01. ලේකම්, පරිවාස, ළමා රක්ෂක හා සමාජ සේවා අමාත්‍යාංශය
02. කොමසාරිස් ,පරිවාස, ළමා රක්ෂක හා සමාජ සේවා දෙපාර්තමේන්තුව

**<u>සබරගමුව පළාත් පරිවාස, ළමාරක්ෂක හා සමාජ සේවා දෙපාර්තමේන්තුවේ</u>**
**<u>II ශ්‍රේණියේ පරිවාස නිලධාරීන් සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2020 නොවැම්බර්</u>**

සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ පරිවාස,ළමාරක්ෂක හා සමාජ සේවා දෙපාර්තමේන්තුවේ II ශ්‍රේණියේ පරිවාස නිලධාරීන් සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය (2020) සඳහා මින් අයදුම්පත් කැඳවනු ලැබේ. විභාගය සිංහල භාෂා මාධ්‍යයෙන් පවත්වනු ලැබේ.

02. මෙම පළාත් රාජ්‍ය සේවයට අයත් පරිවාස,ළමාරක්ෂක හා සමාජ සේවා දෙපාර්තමේන්තුවේ II ශ්‍රේණියේ තනතුරු දරන්නා වූ පරිවාස නිලධාරීන් , ස්වකීය අයදුම්පත් තමාගේ පෞද්ගලික ලිපිගොනුව නඩත්තු කරන කාර්යාලයේ ප්‍රධානියා වෙත භාර දී **2020.11.10 දින** නොඉක්මවා මෙම කොමිෂන් සභා කාර්යාලයට ලැබීමට සැලැස්විය යුතුය.

03. අයදුම්පත් මෙම චක්‍රලේඛය සමඟ එවා ඇති ආදර්ශ ආකෘතිය අනුව පිළියෙල කර ගත් ඒවා විය යුතු අතර එය නිවැරදිව හා පැහැදිලිව අයදුම්කරුගේ අත් අකුරින්ම පිරවිය යුතුය. එම අයදුම්පත්‍රය A 4 ප්‍රමාණයේ කඩදාසියක දෙපසම ප්‍රයෝජනයට ගනිමින් අංක 01 සිට 04 දක්වා පළමු පිටුවට ද ඉතිරිය අනෙක් පිටුවලටද ඇතුළත් වන පරිදි පිළියෙල කළ යුතුය. සබරගමුව පළාත් පරිවාස කොමසාරිස් විසින් තමාට ලැබෙන අයදුම්පත් එකම ආවරණ ලිපියක් මඟින් 2020.11.10 දින හෝ ඊට පෙර ලැබෙන සේ මා වෙත එවිය යුතුය.

04. විභාගය පහත සඳහන් විෂයයන්ගෙන් යුක්ත වූ ප්‍රශ්න පත්‍ර හතරකින් සමන්විත වන අතර, මෙම කාර්යාලය විසින් ඉදිරියේදී පවත්වනු ලබන දෙමළ භාෂා වාචික පරීක්ෂණයකට ද පෙනී සිටිය යුතු වේ. ප්‍රශ්න පත්‍ර හතරම සහ දෙමළ භාෂා වාචික පරීක්ෂණය සමත් වූ පසු සම්පූර්ණ විභාගය සමත් වූවා සේ සැලකේ.

| විෂය අංකය | විෂයය | කාලය | මුළු ලකුණු |
|---|---|---|---|
| 01 | ආයතන සංග්‍රහය (I, II , III, IV,V, VII, XII, XIV, XVI, XVII, XXIII, XXIV, XXVII, XXVIII, XXX, XXXII, ) යන පරිච්ඡේද<br>ආයතන සංග්‍රහය II කාණ්ඩය | පැය 02 | 100 |
| 02 | මුදල් රෙගුලාසි<br>( I - VII දක්වා පරිච්ඡේද ) | පැය 02 | 100 |
| 03 | ආඥා පනත්<br>(අ) ළමයින් හා යෞවනයන් පිළිබඳ ආඥා පනත<br>(ආ) වරදකරුවන් පරිවාස භාරයේ තැබීමේ ආඥා පනත<br>(ඇ) අනාථ දරු නිවාස ආඥා පනත<br>(ඈ) ළමයින් දරුකමට හදාගැනීමේ ආඥා පනත<br>(ඉ) තරුණ වරද කරුවන්ගේ අභ්‍යාස විද්‍යාල ආඥා පනත<br>(ඊ) අයාල ආඥා පනත<br>(උ) නිවර්තන නිවාස ආඥා පනත<br>(ඌ) ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තිය<br>(එ) දණ්ඩ නීති සංග්‍රහය 1995 අංක 22 හා 1998 අංක 29 සංශෝධන<br>(ඒ) දඩ මුදල් ගෙවීමේ ආඥා පනත | පැය 02 | 100 |

| | | | |
|---|---|---|---|
| 04 | දෙපාර්තමේන්තු ස්ථාවර නියෝග<br>පරිවාස නිලධාරීන් සිය කාර්යයන් ඉටු කිරීම සම්බන්ධයෙන් මාර්ගෝපදේශ සඳහන් පරිවාස නිලධාරී ස්ථාවර නියෝග සංග්‍රහයේ සඳහන් කරුණු සම්බන්ධයෙන් දැනුම | පැය 02 | 100 |

- සාමාර්ථය ලැබීමට එක් විෂයයකට අවම වශයෙන් ලකුණු 40%ක් හෝ ඊට වැඩියෙන් ලබාගත යුතු වේ.

05. කරුණාකර මෙම චක්‍රලේඛ ලිපිය ඔබ දෙපාර්තමේන්තුවේ/ ආයතනයේ සිටින සියළුම II ශ්‍රේණියේ තනතුරු දරන්නා වූ පරිවාස නිලධාරීන්ගේ දැන ගැනීම සඳහා වහාම යොමුකරන්න. මෙම විභාගය 2020 නොවැම්බර් මස පැවැත්වීමට අපේක්ෂිතය.

06.මෙම චක්‍රලේඛයේ විධිවිධාන පළසා නොමැති කවර කරුණක් පිළිබඳව වුවද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය අවසාන තීරණය වන්නේය.

පී.එස්.ආර්.එම්.විජයරාජ
ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
සබරගමුව පළාත.

පිටපත් :- 01. ප්‍රධාන ලේකම්, ප්‍රධාන ලේකම් කාර්යාලය, ස.ප.ස. - කාරුණික දැනගැනීමට

ආදර්ශ අයදුම්පත්‍රය

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

සබරගමුව පළාත් පරිවාස,ළමාරක්ෂක හා සමාජ සේවා දෙපාර්තමේන්තුවේ II ශ්‍රේණියේ පරිවාස නිලධාරීන් සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2020 නොවැම්බර්

First Efficiency Bar Examination Prescribed for Probation Officers in grade II of the Department of Probation, Childcare & Social Services, Sabaragamuwa Province – November 2020

01. (අ) මුලකුරු සමඟ නම:-.............................................................................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්) (මුලකුරු අගට යොදන්න. උදා:- SILVA A.B.)

(ආ) සම්පූර්ණ නම :-.............................................................................................................

(ඇ) මුලකුරු සමඟ නම:-.............................................................................................................

(ඈ) රාජකාරී ලිපිනය:-.............................................................................................................
(මෙම ලිපිනයට ප්‍රවේශ පත්‍ර තැපැල් කරනු ලැබේ.)

(ඉ) ස්ත්‍රී / පුරුෂ භාවය:-.......................................................................

(ඊ) ඉදිරිපත් වන විෂය/ විෂයයන්:-

| විෂය | විෂය අංකය |
|---|---|
| ............................................................ | ............ |
| ............................................................ | ............ |
| ............................................................ | ............ |
| ............................................................ | ............ |
| ............................................................ | ............ |

02. ජාතික හැඳුනුම්පත් අංකය:-

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

03. උපන් දිනය:- වර්ෂය [ ] මාසය [ ] දිනය [ ]

04. (අ) ඔබ පරිවාස නිලධාරී II ශ්‍රේණියට පත් වූ දිනය:-.......................................................................

(ආ) 2020.11.10 දිනට එම ශ්‍රේණියේ සේවා කාලය:-.......................................................................

05. ඉහත සඳහන් විස්තර නිවැරදි බවත්, මෙම විභාගයට පෙනී සිටීමට හිමිකම් ඇති බවත් ප්‍රකාශ කරමි. තවද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් විසින් පනවනු ලබන නීති රීතිවලට යටත්වන බවද ප්‍රකාශ කරමි.

දිනය:-

.......................................................................

අපේක්ෂකයාගේ/ අපේක්ෂිකාවගේ අත්සන

---

## අත්සන සහතික කිරීම

මාගේ කාර්යාලයේ නිලධාරියෙකු/ නිලධාරිනියක සහ මා පෞද්ගලික වශයෙන් දන්නා හඳුනන ....................................................................................................... මහතා / මහත්මිය / මෙනවිය ....................................... දින මා ඉදිරිපිටදී අත්සන් කළ බව සහතික කරමි.

දිනය:-

.......................................................................

අත්සන සහතික කරන්නාගේ අත්සන

සටහන:- තමා සේවය කරන කාර්යාලයේ ප්‍රධානියා විසින් අත්සන සහතික කිරීම කළ යුතුය.

---

## දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන

ඉහත අංක 01 සිට 04 දක්වා වූ තොරතුරු නිවැරදි බවත් මෙම අපේක්ෂකයාට / අපේක්ෂිකාවට මෙම විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ඇති බවත් සහතික කරමි.

දිනය:-

.......................................................................

සදවි නාමය:-

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන

(නිල මුද්‍රාව තබන්න.)

| | | | |
|---|---|---|---|
| 04 | දෙපාර්තමේන්තු ස්ථාවර නියෝග<br>පරිවාස නිලධාරීන් සිය කාර්යයන් ඉටු කිරීම සම්බන්ධයෙන්<br>මාර්ගෝපදේශ සඳහන් පරිවාස නිලධාරි ස්ථාවර නියෝග<br>සංග්‍රහයේ සඳහන් කරුණු සම්බන්ධයෙන් දැනුම | පැය 02 | 100 |

❖ සාමාර්ථය ලැබීමට එක් විෂයයකට අවම වශයෙන් ලකුණු 40%ක් හෝ ඊට වැඩියෙන් ලබාගත යුතු වේ.

05. කරුණාකර මෙම චක්‍රලේඛ ලිපිය ඔබ දෙපාර්තමේන්තුවේ/ ආයතනයේ සිටින සියළුම II ශ්‍රේණියේ තනතුරු දරන්නා වූ පරිවාස නිලධාරීන්ගේ දැන ගැනීම සඳහා වහාම යොමුකරන්න. මෙම විභාගය 2020 නොවැම්බර් මස පැවැත්වීමට අපේක්ෂිතය.

06.මෙම චක්‍රලේඛයේ විධිවිධාන සළසා නොමැති කවර කරුණක් පිළිබඳව වුවද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය අවසාන තීරණය වන්නේය.

පී.එස්.ආර්.එම්.විජයරාජ්
ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
සබරගමුව පළාත.

පිටපත් :- 01. ප්‍රධාන ලේකම්, ප්‍රධාන ලේකම් කාර්යාලය, ස.ප.ස. - කාරුණික දැනගැනීමට